# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,124—1960 මැයි 4 වැනි බදාදා—4.5.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අ. ආ. කා. අංකය : O.455/57

ලංකාවෙහි, හන්ගේරියානු මහජන සමූහාණ්ඩුවේ අති විශෙෂ හා පූර්ණ බල තානාපති ලෙස බලය පවරනු ලැබූ, ආචාර්ය ලැස්ලෝ රෙක්සි උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1960 මැයි 2 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

---

## මිළ පාලන දැන්වීම්

**අංක ඇම්. ටී/7/60 දරණ ආහාර මිළ නියෝගය** (සහල්)

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් හෙට්ටිගේ දොන් ටියුඩර් බෝදිදස වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වන වගන්තියෙන් හා 3(2) යන වගන්තියෙන් ද මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව—

(1) අංක 11,790 සහ 1959 ජූනි 26 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක ඇම්.ටී.5/59 සහ 1959 ජූනි 22 වෙනි දින දරණ මිළ නියෝගය, 1960 අප්‍රේල් 11 වෙනි දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) 1960 අප්‍රේල් 11 වෙනි දින සිට මීට යාකර ඇති 1 වෙනි උප ලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් තොග වශයෙන් සියළුම වර්ගවලට අයත් සහල් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක් එම උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් තුළ තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) 1960 අප්‍රේල් 11 වෙනි දින සිට මීට යාකර ඇති 2 වෙනි උප ලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් සිල්ලර වශයෙන් සියළුම වර්ගවලට අයත් සහල් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් එම උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් සීමාවන් තුළ සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) සහල් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා හෝ සහල් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) සහල් ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්.

(5) සහල් විකිණීමේදී වෙනත් ද්‍රව්‍යයක් හා මිශ්‍ර කොට බාල කිරීමෙන් සහල් නොවිකිණිය යුතු බවත් ;

(6) සහල් විකිණීමේදී සහල් යම් කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිළත් එම උප ලේඛනවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් යම් ස්ථානයක හෝ ඒය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම සහල් සඳහා නියම කරනු ලැබූ වැඩිම මිළ සඳහන් දැන්වීමක් එම ස්ථානයේ ප්‍රකටව පෙනෙන සරිදි තැබිය යුතු බවත් ;

(8) එසේම, මෙම නියෝගයේ කාර්ය සඳහා "රාත්තල" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව නියම කරමි.

(9) මේ මිළ නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම හා සහල්

(ආ) සලාක පොත් වලට දෙන සහල් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද, සලාක පොත්වලව දෙන හාල් තවත් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(6) සලාක පොත් වලට දෙන හාල් විකුණන විට ඒ විකුණනු ලබන දෙය යම් කිසි දෙයක ඔතනු ලැබේනම් හෝ නැතහොත් බහාලනු ලැබේ නම් හෝ එහි මිළත් මෙහි සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුලත් වන බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ සලාක පොත් වලට දෙන හාල් සිය ස්වාමිත්වයේ හෝ පාලන යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙලෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මෙම නියෝග යෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කමින් මිළ පුවරුවක සඳහන් කොට එකී ද්‍රව්‍ය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතු බව නියම කරමි.

(8) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා." යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඳුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(9) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සලාක පොත් වලට දෙන හාල් තොග වශ යෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) සලාක පොත් වලට දෙන හාල් විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) සලාක පොත් වල හාල් විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව නියම කරමි.

1960 මැයි මස 2 වැනි දින පෙ. ව. 9ට නුවර එළියේ කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඇස්. ජේ. විජේසේකර,
නුවර එළියේ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

## 1 වැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සලාක පොත්වලට දෙන හාල් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| **නුවර එළියේ කඩවත් සතර** | |
| නුවර එළිය | 14 58 |
| කඳ පොල | 14 79 |
| නානුඔය | 14 34 |
| හග්ගල | 14 79 |
| **වලපනේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය—** | |
| රාගල | 14 68 |
| උඩපුස්සැල්ලාව | 15 06 |
| වතුමුල්ල | 15 69 |
| නිල්දන්ඩාහීන්න | 16 04 |
| **කොටමලේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය** | |
| ආගරපතන | 14 52 |
| තලවකැලේ | 14 21 |
| කොටගල | 14 21 |
| වරගොඩ | 14 38 |
| පූණ්ඩලු ඔය | 14 66 |
| සංගිලිපාලම | 14 99 |
| මල්ලන්ද | 14 81 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

## 2 වෙනි උපලෙඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>සලාක පොත් වලට දෙන හාල් ශුද්ධ බර රාත්තල් දෙකක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| **නුවර එළියේ කඩවත් සතර** | |
| නුවර එළිය | 0 27½ |
| කඳපොල | 0 27½ |
| නානුඔය | 0 27 |
| බැලැක්පූල් | 0 27 |
| රඳැල්ල | 0 27 |
| හග්ගල | 0 27½ |
| කටුමාන | 0 27½ |
| අඹේවෙල | 0 28 |
| **වලපනේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය, ඔයපලාත කෝරලය—** | |
| වතුමුල්ල | 0 29 |
| බටගොල්ල | 0 29½ |
| කුඹල්ගමුව | 0 29½ |
| මිල්ලපිටිය | 0 29½ |
| කැටකඳුර | 0 30 |
| තිබ්බොටුගොඩ | 0 30 |
| පන්නල (ඩබ්ලිව්. ඩී. සිල්වා) | 0 30 |
| පන්නල (වෙනත් වෙළෙන්දෝ) | 0 30½ |
| **මැදපලාත කෝරලේ—** | |
| කලගන්වත්ත | 0 31 |
| ගල්කැටිවෙල | 0 31 |
| උඩමාදුර | 0 31 |
| අරුක්වත්ත | 0 31½ |
| බොලගන්දවල | 0 31½ |
| ඉලුක්තැන්න (ඩබ්ලිව්. කිරිබන්ඩා) | 0 31½ |
| ඉලුක්තැන්න (ඇම්. ඩබ්ලිව්. කිරිබන්ඩා) | 0 32 |
| **යටිපලාත කෝරලේ** | |
| නිල්දන්ඩාහීන්න | 0 30 |
| දෙනබුරේ | 0 30 |
| හරස් බැද්ද | 0 28 |
| කුඹුක්වෙල | 0 29 |
| අඹන්ඇල්ල | 0 31 |
| මඩුල්ල | 0 30 |
| **උඩපලාත කෝරලේ—** | |
| රාගල | 0 27½ |
| සෙන්ට් ලෙනාඩ්ස් | 0 27½ |
| සෙන්ට් මාග්‍රට්ස් (සියලුම වෙලෙන්දෝ) ඇල්. පී. බේබි සිංඤො හැර | 0 28 |
| බෲක් සයිඩ් | 0 28½ |
| සෙන්ට් මාග්‍රට්ස් (ඇල්. පී. බේබි සිංඤෝ) | 0 28½ |
| සූරිය ගහපතන | 0 28½ |
| අඹලියද්ද (ඩබ්ලිව්. ඇම්. පී. බන්ඩා) | 0 29 |
| රුපහ (ඇම්. ඩබ්ලිව්. පී. පියසේන) | 0 29 |
| රුපහ (අනික් වෙලෙන්දෝ) | 0 29½ |
| කරුපනාවෙල | 0 29½ |
| අඹලියද්ද | 0 29½ |
| මාලියදද් | 0 30 |
| **කොත්මලේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය සහ උඩපනේ කෝරලේ—** | |
| පූණ්ඩලුඔය | 0 27½ |
| කුඹල්ඔලුව | 0 27½ |
| දුනුකේ දෙනිය | 0 27½ |
| මැදකුඹුර | 0 28½ |
| හාල් පොල | 0 28 |
| මැතගම | 0 29½ |
| කොත්කුනුගොඩ | 0 28 |
| කලපිටිය | 0 29 |
| හැදුනා | 0 28 |
| උඩගම | 0 28 |
| රාවනාගොඩ | 0 28½ |
| විජේබාහුකන්ද | 0 28 |
| වටගොඩ | 0 27 |

| 1 වැනි තීරය ප්‍රදේශය | 2 වැනි තීරය සලාක පොත් වලට දෙන හාල් ශුද්ධ බර රාත්තල් දෙකක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. |
|---|---|
| **දිඹුල්ල කෝරලේ—** | |
| තලවාකැලේ ... ... ... | 0 26½ |
| විලිකුල්ට්රි ... ... ... | 0 27 |
| වලහ ... ... ... | 0 27 |
| ලිදුල ... ... ... | 0 27 |
| සේන්ට්කුම්බස් | |
| ඉල් ඩන්හෝල් | |
| බෙල්ග්රේවිය | 0 27 |
| හොල්බෲක් | |
| ආගරපතන | |
| ග්ලැන්ලියන් | |
| මැරැයා ... ... ... | 0 27½ |
| දියගම ... ... ... | 0 27½ |
| කොටගල ... ... ... | 0 25½ |
| රොසිටා ... ... ... | 0 27½ |
| පතන ... ... ... | 0 27 |
| බෝගහවත්ත ... ... | 0 27 |
| **පල්ලේපනේ කොරලේ—** | |
| මොරපේ ... ... ... | 0 27 |
| කඩදොර ... ... ... | 0 27 |
| මාස්වෙල ... ... ... | 0 27½ |
| කොටගේ පිටිය ... ... | 0 28 |
| මාවෙල ... ... ... | 0 27½ |
| **තිස්පනේ කෝරලේ—** | |
| වටද්දර ... ... ... | 0 28 |
| නවන්ගම ... ... ... | 0 27½ |
| හරන්ගල (ඩී. ඇම්. පුංචිරාල) ... | 0 27½ |
| හරන්ගල (වෙනත් වෙළෙන්දෝ) ... | 0 28 |
| දොරුවාදෙනිය ... ... | 0 26½ |
| රොජසන්ගම ... ... | 0 27 |
| තිස්පනේ (කේ. බී. ඇස්. කරුණාරත්න) ... | 0 27 |
| හපුගස්තලාව ... ... | 0 27 |
| තිස්පනේ කන්ද ... ... | 0 27 |
| තිස්පනේ (වෙනත් වෙළෙන්දෝ) ... | 0 27 |
| **රම්බොඩ කෝරලේ හා නියන්ගන්දොර—** | |
| සංහිලිපාලම ... ... | 0 28 |
| අඹතලාව ... ... ... | 0 28 |
| නියන්ගන්දොර ... ... | 0 28 |
| කරගස්තලාව ... ... | 0 28½ |
| පනන්ගම්මන ... ... | 0 28½ |
| රම්බොඩගම ... ... | 0 28½ |
| රම්බොඩ වවුම ... ... | 0 29 |
| කුඩාඔය ... ... ... | 0 29½ |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

---

අංක ඇන්. ඊ. 62 දරණ ආහාර මිළ නියෝගය　　　　අතිරේක ද්‍රව්‍ය (මයිසූර් පරිප්පු)

## 1950 අංක 29 දරණ මිළ පාලන පණත

### අවලංගු කිරීමේ නියෝගය

1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් සහකාර මිළ ආහාර පාලක වෙත පැවරී තිබෙන බලතල අනුව සහකාර මිළ පාලක (ආහාර) තැන්පත් සිල්වෙස්ටර් ජස්ටින් විජේසේකර වන මම, පහත සඳහන් මිළ නියෝගය මේ මොහොතේ සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

අංක 12,057 සහ 1960 පෙබරවාරි මස 8 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරණ ලද අංක ඇන් ඊ 58 දරණ අතිරේක ආහාර ද්‍රව්‍ය (මයිසූර් පරිප්පු) පිළිබඳ මගේ ආහාර මිළ නියෝගය.

1960 මැයි මස 2 වැනි දින පෙරවරු 9ට නුවර එළියේ කච්චේරියේ දී අත්සන් තබන ලදී.

ඇස්. ජේ. විජේසේකර,
නුවර එළියේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

---

# අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1960 අංක 185**

අ.ආ.කා. අංකය : C. 162/49 (III).

1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 51 (1) වැනි වගන්තිය යටතේ, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, කම්කරු, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වී. ඇස්. ඇම්. ද මැල් මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, කම්කරු, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ අතිරේක ස්ථිර ලේකම් සී. බී. කුමාරසිංහ මහතා 1960 මැයි 4 වැනි දින සිට, කම්කරු, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තනතුරෙහි වැඩ බැලීමට පත් කල බව, මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1960 මැයි 4 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේදී.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.